# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2288/25 – 2022 ජූලි 15 වැනි සිකුරාදා – 2022.07.15**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2022 අංක 122 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4-3/7/2021/HW/242.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: මීරි/ප්‍රාලේ/ඉ/3

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව සංචාරක හා ඉඩම් අමාත්‍ය, නාලක ජූඩ් හරින් ප්‍රනාන්දු වන මම, පහත සඳහන් උපලේඛනයේ I වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියෙකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමීත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

හරින් ප්‍රනාන්දු,
සංචාරක හා ඉඩම් අමාත්‍ය,

2022 ජූනි මස 30 වැනි දින,
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය,
අංක 1200/6
''මිහිකත මැදුර'',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරී.**- ප්‍රාදේශීය ලේකම් -මීරිගම

2. **ඉඩමේ විස්තරය.** – බස්නාහිර පළාතේ,ගම්පහ දිස්ත්‍රික්කයේ, මීරිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 06, කණ්ඩලම, ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ මිනීඔළුව ගමේ පිහිටි සර්වේ ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක GA/ MEE/2021/478 සහ 2022/01/31 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව සඳහන් නම්වලින් හා ප්‍රමාණවලින් යුත් ඉඩම් කැබලිවලට මායිම්:

01. **කැබලි අංක** A1 – **ප්‍රමාණය: හෙක්. 0.0076**
උතුරට: 510345 වැනි කඩඉම් සිතියමේ 6 වැනි කලාපයේ 110, 106, 107, සහ 108 වැනි බිම් කැබලි; නැගෙනහිරට: 510345 වැනි කඩඉම් සිතියමේ 6 වැනි කලාපයේ 108 වැනි බිම් කැබැල්ල සහ මෙම අණුරේඛණයේ A2 වැනි බිම් කැබැල්ල; දකුණට: A2 වැනි බිම් කැබැල්ල; බටහිරට: 510345 වැනි කඩඉම් සිතියමේ 6 වැනි කලාපයේ 110,106 සහ 107 වැනි බිම් කැබලි.


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

02. **කැබලි අංක** A2 **– කුරියන්කොටුව –ප්‍රමාණය: හෙක්.0.1030** උතුරට: A1 වැනි බිම් කැබැල්ල,510345 වැනි කඩඉම් සිතියමේ 6 වැනි කලාපයේ 108 වැනි බිම් කැබැල්ල සහ මාර්ගය (මාර්ග සංවර්ධන අධිකාරිය); නැගෙනහිරට: මාර්ගය (මාර්ග සංවර්ධන අධිකාරිය) සහ 510345 වැනි කඩඉම් සිතියමේ 7 වැනි කලාපයේ 1 වැනි බිම් කැබැල්ල; දකුණට: 510345 වැනි කඩඉම් සිතියමේ 7 වැනි කලාපයේ 1 වැනි බිම් කැබැල්ල; බටහිරට : 510345 වැනි කඩඉම් සිතියමේ 6 වැනි කලාපයේ 110 වැනි බිම් කැබැල්ල සහ මෙම අනුරේඛනයේ A1 වැනි බිම් කැබැල්ල;

EOG 07-0073

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.